බන්ධනාගාර කොමසාරිස් ජනරාල් චක්‍රලේඛ අංක : 21/ /2015

මගේ අංකය : සේ5/විවිධ/2015
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2015-08-24වන දින.

සියලුම බන්ධනාගාර අධිකාරීන් සහ
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත.

**<u>ආරක්‍ෂණ රැගෙන යාමේ දී විධිමත් ක්‍රියා පිළිවෙතක් අනුගමනය කිරීම හා වියදම් අවම කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් චක්‍රලේඛ අංක බ.කො.ජ./06/2015 යටතේ 2015-01-27 සහ 2015-01-16 දින නිකුත් කර ඇති නියෝග ප්‍රකාරව කටයුතු කිරීමේ දී පැනනැගී ඇති ගැටලු සම්බන්ධයෙන් 2015.06.19 වන දින පැවති විනය හේතූන් මත සිර සැකකරුවන් මාරු කිරීමේ අධිකාරී සාකච්ඡාවේදී අධිකාරීන් විසින් කරුණු ඉදිරිපත් කරණ ලදී .

ඒ අනුව ඉදිරිපත් කරන ලද කරුණු වලට අදාලව ප්‍රායෝගික පහසුව සහ ආරක්‍ෂක විධි විධාන සැලකිල්ලට භාජනය කර, ආරක්‍ෂණ යැවීම සම්බන්ධයෙන් එකී චක්‍රලේඛවල සඳහන් නියෝගවලට අමතරව පහත සඳහන් පරිදි ක්‍රියාකිරීමට කටයුතු කරන ලෙස ආයතන භාර අධිකාරීන් වෙත මෙයින් දන්වමි.

• විශේෂ ආරක්‍ෂණ හා සාමාන්‍ය ආරක්‍ෂණ පිටත් කිරීමේ දී හැකි සෑම අවස්ථාවකම බන්ධනාගාර **නිත්‍ය නියෝග හා සෙසු නියෝග** පරිදි රාත්‍රී කාලයෙන් බැහැරව ආරක්‍ෂණය කිරීමට පියවර ගත යුතුය.

• හදිසි නියෝග අනුව සිදු කළ යුතු ආරක්‍ෂණ හැරුණු කොට අන් සියලු ආරක්‍ෂණයන් සති අන්තයේ යැවීමට වග බලාගත යුතුය . ( මේ සම්බන්ධයෙන් ආයතන භාර අධිකාරී විසින් සුදුසු උචිතම ක්‍රියාමාර්ග ගැනීම සිදුකල හැක ) .

• ආරක්‍ෂණය සිදුකරන මාර්ග සමීපයේ පිහිටා ඇති බන්ධනාගාර ආයතනවල ආරක්‍ෂණයන් ද රැගෙන යා යුතු අතර , ආරක්‍ෂණය පිටත්වන ආයතනයේ සහ භාරගැනීමක් සිදු කරන අතරමැදි ආයතනවල අධිකාරීවරු විසින් පහත සඳහන් පරිදි ක්‍රියා කළ යුතුය.

1. භාර ගැනීමට ආරක්‍ෂණ තිබේද යන්න විමසුම් කිරීම ආරක්‍ෂණය පිටත්වන ආයතනයේ වගකීමකි . (ආරක්ෂණ සඳහා නිළධාරී යොදාගැනීම සාකච්ඡාකර ගත හැක ) .

2. ආරක්‍ෂණයේ යොදවන සිර සැකකරුවන්ගේ ආරක්‍ෂාව, නිලධාරී සංඛ්‍යාව, වාහනයේ පවතින ඉඩ ප්‍රමාණය, පිටත්වන වේලාව අනුව අතරමැදි ආයතනයේ ආරක්‍ෂණය භාර ගැනීමට හැකියාවක් පවතී ද යන්න විමසා ඒ පිළිබඳව සළකා බලා කටයුතු කිරීමට ආරක්‍ෂණය පිටත්වන ආයතනය මගින් සිදුකල යුතුය .

• පිටස්තර බන්ධනාගාර ආයතනවල සිට කොළඹ හරහා වෙනත් බන්ධනාගාර ආයතන වෙත මාරු කර යැවීමට නියමිත සැකකරුවන් ( කල්වේලා ඇතිව ) කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයටත්, සිරකරුවන් වැලිකඩ බන්ධනාගාරයටත් භාරදිය හැක්කේ එම ආයතන දෙකෙහි අධිකාරීවරුන් සමග ඇති කර ගන්නා පූර්ව එකගතාවයකින් පසුවය . භාරගන්නා ලද සිර සැකකරුවන් එම ආයතනයේ ආරක්ෂණයන් මගින් අදාල ආයතන වෙත භාරදීම සිදුකල යුතුවන අතර, එසේ ආරක්ෂණයන් නොමැතිනම් පමණක් එම ආයතන මගින්ම සෘජුවම රැගෙන යාම සිදුකල හැක .

1. කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයේ රැඳවිය නොහැකි ගැටළුකාරී සැකකරුවන් සිටිනම් පමණක් මැගසින් බන්ධනාගාරය වෙත භාරදීම සිදුකල යුතුය.

බන්ධනාගාර කොසාරිස් ජනරාල්
එම්.ඩී.ආර්. පුෂ්පකුමාර
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.